දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

PSC/EST/5/1/28/2/2011

මගේ අංකය / எனது இல. / My No.: 3

ඔබේ අංකය / உமது இல. / Your No.: 12121 උපගොනුව

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

දිනය / திகதி / Date: 2019.06. 07

ලේකම්
තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නිලධර ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය (PL-03) - 2019**

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2019.03.29 හා 2019.04.30 දිනැති ලිපි හා බැඳේ.

02. තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නිලධර (PL-03) සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මෙහි ඇමුණුම 1 හි (පිටු 08 කින් සමන්විත) සඳහන් සංශෝධනයන් ඇතුලත් කිරීමට 2019.06.04 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. මෙ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීම් පටිපාටියට ඇතුලත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

අත්/කළේ: ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්:

1) ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
2) ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු. දැ.ගැ.ස.
3) තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව - කරු. අ.ක.ස.

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය (PL-03) සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - සංශෝධන අංක 01

<table>
<tr><th>අනු අංකය</th><th>ඡේද අංකය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>1</td><td>3.3</td><td>පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :-<br><br>තැපැල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් පවත්වාගෙන යාම සඳහා වූ මූලික අවශ්‍යතාවන් වන ප්‍රවාහනය, වාහන නඩත්තුව හා අළුත්වැඩියාව පැවරෙන්නා වූ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් පිරිනැමෙන D පංතියේ (බර වාහන) රියදුරු බලපත්‍රයක් මගින් තහවුරු කෙරෙන ශිල්පීය හා වෘත්තීය කුසලතා අවශ්‍යවන්නා වූ සේවා ගණයකි.</td></tr>
<tr><td>2</td><td>3.4</td><td>කාර්යයන් පැවරීම:<br><br>ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයනට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.</td></tr>
<tr><td>3</td><td>7.1</td><td>බඳවා ගන්නා අනුපාතය:-<br><br><table><tr><th>ධාරාව</th><th>ප්‍රතිශතය</th></tr><tr><td>විවෘත</td><td>50%</td></tr><tr><td>සීමිත</td><td>50%</td></tr><tr><td>කුසලතා</td><td>නැත</td></tr></table></td></tr>
<tr><td>4</td><td>7.2.2.2</td><td>වෘත්තීය සුදුසුකම් :- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ D පංතියේ (බර වාහන) රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.</td></tr>
<tr><td>5</td><td>7.2.2.3</td><td>පළපුරුද්ද :- D පංතියේ (බර වාහන) රියදුරු බලපත්‍ර ලැබීමෙන් පසුව බර වාහන රියදුරෙකු වශයෙන් වසර 3 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)</td></tr>
<tr><td>6</td><td>7.2.2.4</td><td>(ii) සෑම අයදුම්කරුවෙක්ම දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක, රියදුරු තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය. (ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද වීධිමත් වෛද්‍ය සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය)</td></tr>
<tr><td>7</td><td>7.2.2.5</td><td>IV. සුදුසුකම් ලබන දිනය - තනතුරට බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, ඉහත 7.2.2 සහ පහත 7.2.3 වන ඡේදයන්හි සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේනම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.</td></tr>
<tr><td>8</td><td>7.2.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය:-<br>වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්</td></tr>
<tr><td>9</td><td>7.2.4.1</td><td>ලිඛිත විභාගය :- අදාළ නොවේ</td></tr>
</table>

<table>
<tr><td>10</td><td>7.2.4.1.1</td><td>පවත්වන බලධරයා :- අදාළ නොවේ</td></tr>
<tr><td>11</td><td>7.2.4.2</td><td>වෘත්තීය පරීක්ෂණය : - ප්‍රායෝගික පරීක්ෂණයකි.<br>විස්තර උප ලේඛණ 1 හි දැක්වේ.</td></tr>
<tr><td>12</td><td>7.3.2.2</td><td>වෘත්තීය සුදුසුකම්:- මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ D පංතියේ (බරවාහන ) රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.</td></tr>
<tr><td>13</td><td>7.3.2.3</td><td>පළපුරුද්ද:- (i) D පංතියේ (බර වාහන) රියදුරු බලපත්‍රක් අයදුම්පත් කැදවීමේ අවසන් දිනට වසර 3 කට පෙර ලබා තිබීම.</td></tr>
<tr><td>14</td><td>7.3 ඡේදයට පසුව</td><td>සටහන:- සීමිත ධාරාව යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව, රියදුරු III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් නොවන විට ඉතිරි සංඛ්‍යාව විවෘත ධාරාව යටතේ පුරවනු ලැබේ.</td></tr>
<tr><td>15</td><td>7.3.2.4</td><td>(ii) සෑම අයදුම්කරුවෙක්ම දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක රියදුරු තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය. (ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බව සනාථ කළ යුතුය)</td></tr>
<tr><td>16</td><td>7.3.2.5</td><td>(ii) සුදුසුකම් ලබන දිනය - තනතුරට බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරුවන් ඉහත 7.3.2 ඡේදයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.</td></tr>
<tr><td>17</td><td>7.3.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය:-<br>වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින්</td></tr>
<tr><td>18</td><td>7.3.4.1</td><td>ලිඛිත විභාගය :- අදාළ නොවේ</td></tr>
<tr><td>19</td><td>7.3.4.1.1</td><td>පවත්වන බලධරයා :- අදාළ නොවේ</td></tr>
<tr><td>20</td><td>7.3.4.2</td><td>වෘත්තීය පරීක්ෂණය:- ප්‍රායෝගික පරීක්ෂණයකි.<br>විස්තර උපලේඛණ 1 හි දැක්වේ.</td></tr>
<tr><td>21</td><td>8.1</td><td><table>
<tr><td>කුමන කාර්යක්ෂමතා කඩඉම්ද යන වග</td><td>කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද</td><td>කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත/වෘත්තීය/සහතික/පාඨමාලා /වෙනත්</td></tr>
<tr><td>පළමු කාර්යක්ෂමතා කඩඉම</td><td>III වන ශ්‍රේණියට පත්වී වසර තුන (03) ක් ගතවීමට පෙර</td><td>නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් හා වාචික පරීක්ෂණයකි.<br>(II උපලේඛණ)</td></tr>
<tr><td>දෙවන කාර්යක්ෂමතා කඩඉම</td><td>II වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර තුන (03) ක් ගතවීමට පෙර</td><td>නිපුණතා පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකි.<br>(III උපලේඛණ)</td></tr>
<tr><td>තෙවන කාර්යක්ෂමතා කඩඉම</td><td>I වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර පහ (05) ක් ගතවීමට පෙර</td><td>නිපුණතා පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකි.<br>(IV උපලේඛණ)</td></tr>
</table>විෂය නිර්දේශ උප ලේඛණ II, III, හා IV හි දැක්වේ.</td></tr>
</table>

<table>
<tr><td>22</td><td>8.3</td><td>කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද:-<br>පළමු කාර්යක්ෂමතා කඩඉම :- තැපැල්පති විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්<br>දෙවන කාර්යක්ෂමතා කඩඉම :- තැපැල්පති විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්<br>තෙවන කාර්යක්ෂමතා කඩඉම :- තැපැල්පති විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්</td></tr>
<tr><td>23</td><td>9.1</td><td>
<table>
<tr><td></td><td>ශ්‍රේණිය</td><td>ලබා ගත යුතු ප්‍රවීණතාව</td></tr>
<tr><td>01</td><td>රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.</td></tr>
<tr><td>02</td><td>අනෙක් රාජ්‍ය භාෂාව</td><td>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යතුය.</td></tr>
</table>
</td></tr>
<tr><td>24</td><td>11.2.1</td><td>විවෘත සහ සීමිත අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට භාජනය කර එහිදී දක්වන කුසලතාවය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ලක්කර පවත්නා ඇබෑර්තු වලට පත් කරනු ලැබේ.</td></tr>
<tr><td>25</td><td>13</td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-<br>සක්‍රීය සේවා කාලය :-<br>"සක්‍රීය සේවා කාලය" යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.</td></tr>
<tr><td>26</td><td>15</td><td>සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1580/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රයේ විධිවිධාන අදාළ වේ.</td></tr>
<tr><td>27</td><td>16</td><td>මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සළසා නොමැති යම් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.</td></tr>
</table>

උප ලේඛනය I

01. වෘත්තීය පරීක්ෂණය: <u>ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහිප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය.</u>

02. තැපැල්පති විසින් තීරණය කරන පරිදි පහත සඳහන් නිලධාරීන්ගෙන් යුතු පරීක්ෂණ මණ්ඩලයක් මගින් ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්විය යුතුය.

1. <u>තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙක් (සභාපති)</u>
2. <u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරීක්ෂකවරයෙක්</u>
3. <u>පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙක්</u>

මෙම ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායකයන් උපයෝගි කර ගත යුතු වේ.

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| I. | <u>රිය පැදවීමේ නිපුණත්වය</u> | <u>40</u> | <u>20</u> |
| II. | <u>මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම</u> | <u>40</u> | <u>20</u> |
| III. | <u>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</u> | <u>20</u> | <u>10</u> |

★ <u>සියළු විෂයයන් එක් වරකදී සමත් විය යුතුය.</u>

උප ලේඛනය II

01. විභාගයේ නම : <u>ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ III වන ශ්‍රේණියේ තැපැල් රියදුරු තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.</u>

02. විභාගය පිළිබඳ විස්තර :

<u>නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයක් හා වාචික පරීක්ෂණයකි.</u>

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකි. | 50 | 20 |
| වාචික පරීක්ෂණය | 50 | 20 |
| එකතුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : තැපැල්පති

* <u>නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය:</u>

<u>තැපැල්පති විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් විසින්</u>

I. <u>තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු (සභාපති)</u>
II. <u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකු</u>
III. <u>පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු</u>

* <u>වාචික පරීක්ෂණය:</u>

<u>තැපැල්පති විසින් පත් කරනු ලබන වාචික පරීක්ෂණ මණ්ඩලයක් විසින්</u>

04. විභාගය පවත්වන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| <u>නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය</u> | <u>1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම</u><br><u>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</u> |

| | |
|---|---|
| වාචික පරීක්ෂණය<br><br>1. ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම<br><br>2. රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>• මෝටර් රථ රියදුරන්ගේ රාජකාරි හා වගකීම<br>• රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරුගේ වගකීම<br>• දෛනික ධාවන සටහන් පොත<br>• වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යෑම<br>• වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>• රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග |

06. සියලුම විෂයයන් එකවර සමත් විය යුතුය.

01. විභාගයේ නම : <u>ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ I වන ශ්‍රේණියේ තැපැල් රියදුරු තනතුර සඳහා වන කෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.</u>

02. විභාගය පිළිබඳ විස්තර :<u>නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.</u>

| | විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. | <u>මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම</u> | 50 | 20 |
| II. | <u>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</u> | 50 | 20 |
| | එකතුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : <u>තැපැල්පති විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් විසින්</u>

I. <u>තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු (සභාපති)</u>
II. <u>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකු</u>
III. <u>පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු</u>

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

<table>
<tr><th></th><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>විෂයය නිර්දේශය</th></tr>
<tr><td>(I)</td><td><u>මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම</u></td><td rowspan="2"><u>මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගතවූ සේවා කාලය තුළ සිදු වී ඇති පරිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සිදු කෙරේ.</u></td></tr>
<tr><td>(II)</td><td><u>මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම</u></td></tr>
</table>

06. <u>සියලුම විෂයයන් එකවර සමත් විය යුතුය.</u>

01. විභාගයේ නම : ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ II වන ශ්‍රේණියේ තැපැල් රියදුරු තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර :නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

| | විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I. | මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 20 |
| II. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| | එකතුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : තැපැල්පති විසින් පත් කරනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් පරීක්ෂණ මණ්ඩලයක් විසින්

I. තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු (සභාපති)
II. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයකු
III. පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| (I) | මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගතවූ සේවා කාලය තුළ සිදු වී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සිදු කෙරේ. |
| (II) | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | |

06. සියලුම විෂයයන් එකවර සමත් විය යුතුය.